**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2022**

---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කාර්යාංශයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන් ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කායීාංශයේ ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතේ VIII වන පරිච්ඡේදයේ 42(2) වගන්තියේ (ආ),(ඉ) සහ (ඌ) උපවගන්ති | සංචාරක වෙළඳපලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදුකිරීමට වග බලාගැනීම සඳහා සැලසුම් කල පොදු ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම, සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන ආදී වැඩසටහන් වල නිරත තැනැත්තන්ට සහ සංවිධාන වලට වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන කාර්යාංශයට මගපෙන්වීම ලබාදීම යන පරමාර්ථ සමාලෝචිත වර්ෂය දක්වා කාර්යාංශය විසින් ඉටුකර නොතිබුණි. | සංචාරක කර්මාන්තය සඳහා කාර්යාංශය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් වෘත්තීය ප්‍රමිතීන් ස්ථාපිත කිරීමට කටයුතු කරයි. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ නියමිත පරිදි කාර්යාංශයේ පර්යේෂණ අංශය විසින් සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන (MICE) අංශය සඳහා කාර්යාංශයේ MICE පුහුණු වැඩසටහන බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පූර්ණ දින වැඩමුළුවක් ලෙස පවත්වන ලදී. නැවත පුහුණු වැඩසටහනක් 2022 සැප්තැම්බර් 15 වන දින උතුරු කලාපයේ යාපනය තින්නයි හෝටලයේ පූර්ණ වැඩමුළු දිනයක් ලෙස පවත්වන ලදී. | සංචාරක කර්මාන්තයේ ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව අලෙවි කිරීම සහතික කිරීම , සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන යනාදිය හැසිරවීමට සම්බන්ධ පුද්ගලයින් හෝ සංවිධාන සඳහා වෘත්තීය ප්‍රමිතීන් නියම කිරීම සහ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන කාර්යාංශයට මාර්ගෝපදේශ සැපයීම සඳහා පොදු ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසෙහි 11 වැනි ඡේදය | 2020 සහ 2021 වර්ෂවල භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රුපියල් 118,000,000ක කෙටිකාලීන ආයෝජනයක් සහ රුපියල් 32,000,000ක දිගුකාලීන ආයෝජනයක් සිදු කර තිබුණි. | කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන සඳහා අනුමැතිය සඳහා වන ඉල්ලීම දැනටමත් මහා භාණ්ඩාගාරය වෙත යවා ඇත. | භාණ්ඩාගාර අනුමැතිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| ඇ) 2015 මාර්තු 26 දිනැති අංක 07/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව ගෙවිය හැකි අත්තිකාරම් මුදල රුපියල් 10,000 කි. අමාත්‍යාංශ ලේකම්වරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත එය රුපියල් 25,000 දක්වා වැඩි කර තිබුණි. ඒ අනුව 2021 සහ 2022 වර්ෂ සඳහා එක් සේවකයෙකුට වසරකට රුපියල් 25,000 බැගින් සේවකයින් 14 දෙනෙකු සඳහා උත්සව අත්තිකාරම් වශයෙන් රු.700,000ක් ගෙවා තිබුණි. සේවයෙන් ඉවත් වී තිබූ සේවකයින් තිදෙනෙකුගෙන් රුපියල් 150,000 ක මුදලක් අයකරගෙන තිබුණි. කෙසේ වෙතත්, ඉතිරි මුදල වූ රු.550,000 2022 දෙසැම්බර් 31 වන දින දක්වා අය කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 22 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී භාණ්ඩාගාර නියෝජිත විසින් 2022/12/13 දින සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් 2021 සහ 2022 වර්ෂවල සිංහල සහ දෙමළ අලුත් අවුරුදු විශේෂ දීමනාව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවීම සම්බන්ධයෙන් යවන ලද ලිපියක් සභාගත කරන ලදී. . මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර 2021 සහ 2022 සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් ගෙවන ලද විශේෂ දීමනාව භාණ්ඩාගාර නියෝගවලට අනුව ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ කාර්ය මණ්ඩලයෙන් අයකර ගන්නා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දෙන ලදී. අයකර ගැනීමේ ක්‍රියාවලිය 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ කර ඇති අතර ආර්ථික පසුබෑම සැලකිල්ලට ගනිමින් ඉහත සඳහන් මුදල | නිසි අනුමැතියකින් තොරව අතිරේක ගෙවීම් නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සමාන වාරික 20 කින් අයකර ගැනීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. | |
| ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත (SOE)<br>i) 3.2(i) ඡේදය | ආයතනයේ ප්‍රවාහන දීමනාව ලෙස ගෙවනු ලබන රු.4000 ක දීමනාවට අමතරව 2022 ඔක්තෝම්බර් 01 දින සිට රු.6000 ක අමතර දීමනාවක් රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය ඇතිව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට අමතර දීමනාවක් ලෙස ගෙවා තිබූ මුදල රුපියල් 126,000 ක් වී තිබුණි. | 2005 අංක 38 දරන සංචාරක පනතේ 15 (2) (ආ) වගන්තියට අනුව සංචාරක අමාත්‍යවරයා ලෙස ඔහුට පැවරී ඇති බලතල අනුව ගරු සංචාරක සහ ඉඩම් අමාත්‍ය හරීන් ප්‍රනාන්දු මහතා 2022.09.23 දිනැති ලිපිය මගින් සංචාරක කාර්ය මණ්ඩලයට ප්‍රවාහන දීමනාව රු.4,000/- සිට රු.10,000/- දක්වා වැඩි කිරීමට ලබා දුන් නියෝගය සම්බන්ධයෙන් 2022 ඔක්තෝබර් 27 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු පත්‍රිකාවක් සභාගත කරන ලදී. භාණ්ඩාගාර නියෝජිත හැර අනෙකුත් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තොරතුරු පත්‍රිකාව පිළි ගත්හ. මණ්ඩලයේ අනුමැතියෙන් පසුව ප්‍රවාහන දීමනාව ගෙවීම සිදු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව දීමනා නොගෙවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.95,382,436ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.13,133,911ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.82,248,525 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ අපගමන බදු ආදායම රු.84,555,293 කින් වැඩිවීම සහ කෙටිකාලීන තැන්පතු පොලී රු.17,386,202 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**විගණන නිරීක්ෂණය**

---------------------

2021 නොවැම්බර් 24 වැනි දින නඩත්තු කටයුත්තක් සඳහා ආයතනයකට යවන ලද වාහනයක් අදාළ නඩත්තු කටයුතු අවසන් වී වර්ෂ 1 යි මාස 03 කට පසු ආපසු එවා තිබුණි. කෙසේ වෙතත්, තවත් දෝෂ කිහිපයක් හේතුවෙන් වාහනය නඩත්තු කටයුතු සඳහා ආපසු යැවිය යුතුව තිබූ නමුත් 2023 වර්ෂයේදී බිල් වටිනාකම වූ රු.1,179,686 න් සියයට 75 ක් ගෙවීමට කාර්යාංශය කටයුතු කර තිබුණි.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

----------------------------------

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ කාර්මික නිලධාරියා අලුත්වැඩියා කිරීමේ ආයතනය වූ ලක්දිව ඉංජිනේරු ආයතනය වෙත කිහිප වතාවක් ගිය අතර අලුත්වැඩියාව අවසන් කිරීමට වසරකට වැඩි කාලයක් ගත විය. වාහනය නැවත ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙත 2023 පෙබරවාරි 1 වන දින භාර දෙන ලදී. සම්පූර්ණ අලුත්වැඩියා පිරිවැය රු.1,179,686/- කි. ලක්දිව ඉංජිනියරින් විසින් වාහනය මුදා හැරීම සඳහා සම්පූර්ණ ගෙවීම අවශ්‍ය බව අවධාරනය කරන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් සාකච්ඡා කර 75% ක් ගෙවීමෙන් ඉතිරි ගෙවීම දින 30 ක් ඇතුළත ලබා දීමට එකඟ විය. වාහනය දෙතුන් වතාවක් රැගෙන යාමට සූදානම් බව ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට දැනුම් දෙන ලදී. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය ගිය සෑම අවස්ථාවකම ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් යෙදවීමට වාචිකව සන්නිවේදනය කරන ලදී. අන්තිමට ලක්දිව ඉංජිනියරින් වාහනේ රැගෙන යාමට බල කරන ලදී. ශේෂය ගෙවීම මෙතෙක් සිදු කර නොමැති අතර ඒ සම්බන්ධයෙන් සංචාරක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් උපදෙස් ලබා ගැනීමට සැලසුම් කර ඇත. 25% ක ඉතිරි ගෙවීම ලේකම් නියෝගයෙන් ගෙවීමට සැලසුම් කර තිබියදී, ලක්දිව ඉංජිනියරින් ශේෂය වහාම ගෙවන ලෙස ඉල්ලීම් කර ඇත.

**නිර්දේශය**

--------------------------

වාහන නඩත්තු කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කළ යුතු අතර ගෙවීම් කිරීමට පෙර නිම කරන ලද වැඩ පිළිබඳව සෑහීමකට පත් විය යුතුය.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අප්‍රේල් 26 දින ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ බංග්ලාදේශයේ MICE ප්‍රවර්ධන වැඩසටහන සත්‍ය වශයෙන්ම මාස 4කට පසු එනම් 2022 සැප්තැම්බර් 01 දින පවත්වන ලදී.<br>රු. 3,778,622 ක වියදමින් එය සංවිධානය කර තිබුණි. එහෙත් අපේක්ෂා කළ සංචාරක නිලධාරීන් 80 දෙනෙකුගේ පැමිණීම සතුටුදායක මට්ටමක නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ඩකා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ආරාධනා කරන ලද MICE කර්මාන්තයේ පාර්ශවකරුවන් 90 දෙනෙකු සහ මාධ්‍යවේදීන් 30 දෙනෙකු අතරින් සංචාරක නියෝජිතයින් 53 දෙනෙකු සහ මාධ්‍යවේදීන් 14 දෙනෙකු පමණක් සහභාගී වී ඇති බව නිරීක්ෂණය විය.<br>එපමණක් නොව, වැඩසටහන පැවති පරිශ්‍රයේ ඉඩ ප්‍රමාණවත් නොවීම, අන්තර්ජාල පහසුකම් නොමැතිකම, විදුලිය බිඳවැටීම් ආදී ගැටලු හේතුවෙන් වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිඵල සතුටුදායක මට්ටමකට ළඟා වී නොමැති බව නිරීක්ෂණය විය. | රටේ පැවති තත්ත්වය හේතුවෙන් වැඩසටහන ප්‍රමාද විය . රට මුහුණ දී ඇති විදේශ විනිමය ගැටළුව සලකා බලා ශ්‍රී ලංකා මහ කොමසාරිස් පරිශ්‍රයේ දී වැඩසටහන සංවිධානය කරන ලෙස කළමනාකාරීත්ව මණ්ඩලය උපදෙස් දී ඇත. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් මහජන සම්බන්ධතා සමාගම සමඟ සම්බන්ධීකරණයෙන් හෝටලයක සැලසුම් කළ පරිදි වැඩසටහන සංවිධානය කළේ නම්, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය හට අවශ්‍යව තිබූ පාර්ශවකරුවන්ගේ පැමිණීම වැඩි කර ගැනීමට හැකි වනු ඇත. පශ්චාත් සිදුවීම් සම්බන්ධ වාර්තාවේ අත්විඳින ලද ගැටළු පැහැදිලිව සඳහන් කර ඇති අතර ඒවා කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර අනාගතයේදී එවැනි තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය නිර්දේශ ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් පවත්වනු ලබන වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල සතුටුදායක මට්ටමින් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ (SOE) 3.4 ඡේදයට අනුව, සෑම රජය සතු ව්‍යවසායයකටම අනුප්‍රාප්තික සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කාර්යාංශය අද දක්වා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි. | දැනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට අනුප්‍රාප්තික සැලැස්මක් නොමැති නමුත් ඉදිරියේදී අනුප්‍රාප්තික සැලැස්ම සකස් කිරීමට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය කටයුතු කරනු ඇත. | කාර්යාංශය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 උපායමාර්ගික සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායයන් සඳහා යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදයට අනුව, උපායමාර්ගික සැලැස්ම වසර පහක කාලයක් සඳහා සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. තවද, ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව සෑම වසරකම සැලැස්ම යාවත්කාලීන කළ යුතු අතර, ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර, මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, කාර්යාංශය සඳහා උපාය මාර්ගික සැලැස්මක් 2020-2023 දක්වා වසර හතරක් සඳහා සකස් කර තිබූ අතර එය අද දක්වා යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරි පස් අවුරුදු කාලය සඳහා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමට සහ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව වාර්ෂිකව යාවත්කාලීන කිරීමට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | උපායමාර්ගික සැලැස්ම වසර පහක කාලයක් සඳහා සකස් කළ යුතු අතර සෑම වසරකම යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායයන් සඳහා යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.4 ඡේදයට අනුව, විගණන කමිටුව හරහා මණ්ඩලයට පමණක් වාර්තා කරන අභ්‍යන්තර විගණකවරයෙකු සෑම රජය සතු ව්‍යවසායයකටම සිටිය යුතුය. කෙසේ වෙතත්, කාර්යාංශයේ සහකාර කළමනාකරු - අභ්‍යන්තර විගණන තනතුර 2022 සැප්තැම්බර් 09 සිට මේ දක්වා පුරප්පාඩු වී තිබුණි. | පුරප්පාඩු වූ තනතුර පිරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය දැනටමත් ඉල්ලා ඇත. සංචාරක අමාත්‍යාංශයෙන් ලැබුණු උපදෙස් අනුව, රජය විසින් බඳවා ගැනීම් දැනට අත්හිටුවා ඇති බැවින් රජය බඳවා ගැනීමේ අත්හිටුවීම ඉවත් කරන තෙක් අභ්‍යන්තර සේවකයෙකු විසින් සහකාර කළමණාකරු - අභ්‍යන්තර විගණකගේ රාජකාරිය ඉටු කරන ලෙස උපදෙස් දී ඇත. රජයේ සීමාවන් ඉවත් කළ වහාම බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කෙරේ. | තනතුර පිරවීමට අවශ්‍ය කටයුතු ඉක්මනින් සිදු කළ යුතුය. |